# සුදූ හාමිනේ

සුදූ හාමිනේ නුඹ කොතනද අද දවසේ
දීගෙක ගිහින් දරූ පිරි වර මැද සුවසේ
ලේලිය කැටුව මගෙ පුතු වෙන් විය රහසේ
මං විතරයි තනියම දැන් මගෙ නිවසේ

නුඹලගෙ තාත්තා ඈත දුර බලාගෙන
කවදා දූ පුතුන් එදැයි පතාගෙන
වේවැල් කැඩුණු පුටුවේ වක ගසාගෙන
මං ඉන්නවා දුක් කඳුළැලි දරාගෙන

සුදූ හාමිනේ ...

දරුවන් ඇඳුම් ඇඟැළුම් ගෙන සිඹින්නෙමී
මනසින් එදා කෙළි සෙල්ලම් දකින්නෙමී
මරණයෙ දොරකඩට සපැමිණ සිටින්නෙමී
ලේ කිරි කෙරූ දරුවන් දැක මියෙන්නෙමී

සුදූ හාමිනේ ...

*නන්දා මාලනී*